ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක - 13/2015

මගේ අංකය - HA/ADM/05/08/CIR/2015

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

නිදහස් චතුරස්‍රය

කොළඹ 07

2015.12.29

අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්,

<u>**ශ්‍රී ලංකාව තුළ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් ශක්තිමත් කිරීමේ සද්කාර්යයට කැපවෙමු.**</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්ගේ අංක SB/2/1 හා 2015.12.29 දිනැති ලිපිය හා බැඳේ.

02. නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය යළි තහවුරු කිරිම වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ සිදු කළ ජනතා මෙහෙවරෙහි පළමු සංවත්සරය 2016 ජනවාරි මස 08 වන දිනට යෙදී ඇත.

03. එබැවින්, මෙම දිනය සංකේතවත් කිරිම සඳහා සහ එකම ජාතියක් ලෙස එකට ජීවත්වීමේ අපේක්ෂාවෙන් පසුවන විවිධ ආගමික හා වාර්ගික ජන කොටස් අතර සාමකාමීබව, සුහදශීලී සහජීවනය සහ සංහිඳියාව වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව 2016 ජනවාරි මස 01 සිට 08 දින දක්වා ජාතික කොඩිය ඔසවා තබන ලෙසත්, මේ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින සියළුම ආයතන දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලමි.

ජේ.ජේ. රත්නසිරි

ලේකම්

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පිටපත්

1. ජනාධිපති ලේකම් - කරු. දැ.ග.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ග.ස.